## හඳුනාගත් ඉදිකිරීම් වැඩ

### 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි ප්‍රතිපාදන ක්‍රියාවට නැංවීම සම්බන්ධව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි සභාපති තුමන් විසින් පලකරනු ලබන නිවේදනයයි.

"හඳුනාගත් ඉදිකිරීම් වැඩ" ඉටු කිරීමෙහිදී ඉදිකිරීම් කර්මාන්තයෙහි සියළු පරදු දරන්නන් විසින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි පහත සඳහන් ප්‍රතිපාදන අනුගමනය කළ යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි ප්‍රතිපාදන ප්‍ර කාරව පහත සඳහන් අවශ්‍යතාවයන් පරිපූර්ණ කළ යුතු බව ඉදිකිරීම් කර්මාන්තයෙහි සියළු පරදු දරන්නන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

<u>28 වන වගන්තිය</u>

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි 28 වන වගන්තිය ප්‍රමකාරව, යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩ කරගෙන යාම, නිර්මාණ කිරීම, අවශ්‍යප ගිවිසුමක ලේඛන සැකසීම සහ එම නියමිත ඉදිකිරීම් වැඩවල අධීක්ෂණය ද යනාදී කාර්ය සඳහා හෝ ඒවායේ නියුක්ත කරලීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු හැර වෙනත් තැනැත්තෙකු පත් කරනු නොලැබිය යුතුය.

<u>29 වන වගන්තිය</u>

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි 29 වන වගන්තිය ප්‍රමකාරව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගත් ඉදිකිරීම් වැඩ සම්බන්ධ වාර්තා පවත්වාගෙන යා යුතුය.

ඒ අනුව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 29 වන වගන්තියේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකාව තුළ සිදු කෙරෙන සියළු 'හඳුනාගත් ඉදිකිරීම් වැඩ' සම්බන්ධ සේවා යෝජකයන් විසින් අදාළ හඳුනාගත් ඉදිකිරීම් වැඩෙහි "පිළිගැනීමේ ලිපිය" හි පිටපතක් එකී ලිපිය අත්සන් කිරීමෙන් එක් මාසයක් ඉක්මවා යාමට පෙර වූ කාල වකවානුවක් තුළ, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත එවිය යුතුය.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි දී ඇති අර්ථකථනයට අනුව හඳුනාගත් ඉදිකිරීම් වැඩ යනුවෙන් අදහස් වනුයේ "රුපියල් මිලියන දහයකට වැඩි හෝ අමාත්‍යාවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි ඊට වඩා යම් වැඩි වටිනාකමකින් යුක්ත වන, මහජනයාගේ භාවිතය සඳහා වන ඉදිකිරීම්" වේ.

<u>31 වන වගන්තිය</u>

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි 31 වන වගන්තියේ ප්‍රකතිපාදන ප්‍රිකාරව, වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුවද, යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක් සම්බන්ධයෙන් අදාළ වන වාස්තු විද්‍යාභත්මක, ව්‍යුහමය, විදුලි සහ ජල සම්පාදන, මළාපවාහන සහ එම හඳුනාගත් ඉදිකිරීම් වැඩට අදාළ අනෙකුත් සැලසුම් සහ සේවාවන් සුදුසුකම්ලත් තැනැත්තෙකු විසින් සිදු කරනු ලබන්නේ නම් මිස එම ඉදිකිරීම් කටයුත්ත සම්බන්ධයෙන් ගොඩනැගිලි අනුමත කිරීම සඳහා වූ ඉල්ලීමක් කිසිදු පළාත් පාලන ආයතනයක් විසින් භාර නොගත යුතුය."

38 වන වගන්තිය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි 38 වන වගන්තියේ ප්‍රලතිපාදන ප්‍රසකාරව, සෑම හඳුනාගත් ඉදිකිරීම් වැඩක්ම ලියාපදිංචි කොන්ත්‍රා ත්කරුවෙකු විසින් තත්කාර්ය සඳහා නියම කරනු ලැබිය හැකි කාර්ය පටිපාටියට සහ ප්‍රිමිතීන්ට අනුකූලව කරගෙන යා යුතුය.

අධිකාරිය විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා නොගෙන යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක් කිරීමට භාර ගනු ලබන හෝ කරගෙන යන යම් තැනැත්තෙකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේය.

46 වන වගන්තිය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි 46 වන වගන්තියේ ප්‍රකතිපාදන ප්‍රමකාරව, යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක් සඳහා උපදේශකයෙකු ලෙස හෝ ලියාපදිංචි කොන්ත්‍රාාත්කරුවෙකු ලෙස සුදුසුකම්ලත් තැනැත්තෙකු යොදා ගන්නා යම් පාර්ශවයක් විසින්, තත්කාර්ය සඳහා අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ප්‍රෙමිති ලේඛන යොදා ගත යුතුය.

56 වන වගන්තිය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි 56 වන වගන්තිය ප්‍රරකාරව, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කරන හෝ එවැනි විධිවිධානයකට හෝ නියෝගයකට අනුකූලවීම පැහැර හරින යම් තැනැත්තෙකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේය.

**සභාපති**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**
**2017.07.31**